**පළාත් මාර්ග ව්‍යාපෘතිය - (නැගෙනහිර පළාත) - 2015**

**------------------------------------------------------------------**

පළාත් මාර්ග ව්‍යාපෘතියේ - (නැගෙනහිර පළාත) 2015 ජනවාරි 01 සිට ඔක්තෝබර් 15 දක්වා ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------------**

පළාත් මාර්ග ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් නැගෙනහිර පළාතේ සමාජ - ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,000 කට සමාන එජඩො මිලියන 20 ක් වන අතර මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු 2015 ඔක්තෝබර් 15 දක්වා පවත්වා ගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ

තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ හා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව සහ 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 ඔක්තෝබර් 15 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ හා එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) විශේෂ ඩොලර් ගිණුමේ පැවතුණු රු. මිලියන 41.88 කට සමාන එජඩො 296,524 ක ශේෂය 2015 සැප්තැම්බර් 29 දින ණය සපයනු ලබන නියෝජිතායතනය වෙත ආපසු යවා තිබුණි. කෙසේ වුවද, විශේෂ ඩොලර් ගිණුමේ රු. මිලියන 39.82 ක් වූ ශේෂය 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) මල්වත්ත - සූරිප්පොඩායි මාර්ගයේ පිහිටි පාලම් 02 ක් ඉදිකිරීමේ නියුතු කොන්ත්‍රාත්කරුට ගෙවීම් තීරණය කිරීමේදී යොදා ගත් ගාස්තු සම්බන්ධයෙන් ආරාවුල් බේරුම්කරුගේ තීරණය අනුව, රු. මිලියන 40.04 ක මුදලක් පියවීමට ව්‍යාපෘතියට නියම විය. කෙසේ වුවද, ඉහත තීරණය සම්බන්ධයෙන් ව්‍යාපෘතිය අභියාචනා කර තිබුණි. ඒ සම්බන්ධයෙන් අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අරමුදල් උපයෝජනය සහ 2015 ඔක්තෝබර් 15 දිනට සමුච්චිත වියදමට අදාළ, වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ | | 2015 ඔක්තෝබර් 15 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 20 | 2,000 | 247 | 1.44 | 192.70 | 18.91 | 2,515.90 |
| ශ්‍රීලංර | - | - | 20 | 0.01 | 1.92 | 0.10 | 14.22 |
| එකතුව | 20 | 2,000 | 267 | 1.45 | 194.62 | 19.01 | 2,530.12 |

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ආරම්භක සැලැස්ම අනුව, නැගෙනහිර පළාතේ පළාත් මාර්ග කිලෝමීටර 100 ක් වැඩි දියුණු කිරීමට හා පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ඒ අතුරින්, නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ කිලෝමීටර 38.35 ක් වූ පළාත් මාර්ග 11 ක් පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුල වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම කර තිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, කාලය සීමා වීම හේතුවෙන් පැකේජ ඊපී-08 යටතේ වූ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කාර්යයන් අවසන් කිරීමට 2014 නොවැම්බර් 19 ලිපිය මගින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය දැනුම්දී තිබුණි. කෙසේ වුවද, ණය සපයනු ලබන නියෝජිතායතනයේ අනුමැතියකින් තොරව රු.මිලියන 143.44 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට පැකේජ අංක ඊපී-08 යටතේ ග්‍රාමීය මාර්ග 03 ක් පුනරුත්ථාපනය කිරීමට 2014 නොවැම්බර් 12 දින ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. තවද, 2014 නොවැම්බර් 30 දින මාර්ග පුනරුත්ථාපන කාර්යයන් සඳහා වූ උපදේශන සේවා ගිවිසුම නිම වීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වූ මාර්ග වල තත්ත්වය ගැටළුකාරීව පවතී.

**3.3** **මතභේදයට තුඩු දෙන කරුණු**

**-----------------------------------**

මල්වත්ත-සූරිප්පොඩායි මාර්ගයේ පිහිටි පාලම් 02 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් වූ බේරුම්කරණ ක්‍රියාවලියෙන් ඇති විය හැකි වියදම් දැරීමට පැකේජ ඊපී-01 යටතේ වෙන් කරන ලද ණය මුදලින් රු.මිලියන 132.08 ක මුදලක් රඳවා තැබීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට 2015 ජුලි 07 දින බේරුම්කරණ මණ්ඩලය ව්‍යාපෘතියට උපදෙස් දී තිබුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් අනුමැතිය ලබා ගෙන බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා අරමුදල් රඳවා ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.  බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා වියදම් දැරීමට ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන්, රු.මිලියන 2.39 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.4** **ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම**

**------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙනෝර, විදුලි උඳුන්, සම්පීඩන පරික්ෂණ යන්ත්‍ර, ඇස්පෝල්ට් කේන්ද්‍රපසාරක නිස්සාරක සහ විදුලි තරාදි වැනි විද්‍යාගාර උපකරණ කිහිපයක් 2015 ජනවාරි 26 දින අම්පාර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාලය වෙත ව්‍යාපෘතියේ උපදේශක කාර්යාලය භාරදී තිබුණි. වත්කම් භාරදුන් දිනයේ සිට අදාල උපකරණ විධායක ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ අක්‍රියව පවතී.

(ආ) 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණ කර තිබුණද, ඇවර කිරීමේ කටයුතු සඳහා මූලා ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට ව්‍යාපෘතිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.